**වත්තේගම නගර සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**----------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 23 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වත්තේගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතුව භෞතිකව නොතිබුණු රු.209,990 ක් වටිනාකම වූ වාහන 2 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | තවදුරටත් සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | ඉකුත් වර්ෂවල පෙර ගෙවුම්වල එකතුව රු.563,628 ක් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි. | ගිණුම්වල ගැලපීම් කර නිවැරදිව ගිණුම් ඉදිරිපත් කළ යුතු වේ. | මෙම ශේෂ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු හා උසාවි දඩ උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.64,863,864 ක් වූ ගිණුම් විෂයන් 5 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.3,879,276 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. |

(ඇ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 3 ක එකතු වටිනාකම රු.5,500,261 ක් වූ අතර, එයින් වර්ෂ 1-5 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.281,714 ක් හා වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ රු.2,015,653 ක ශේෂයක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.7,727,572 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළව උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | 2018 වර්ෂයේ තිරසාර සංවර්ධන වැඩසටහන යටතේ සහා අරමුදල් මඟින් ගෙවතු හිමියන් වෙත බෙදා දීම සඳහා අපනයන බෝග පැළ 1500 ක් මිලට ගෙන තිබුණු අතර, ඉන් පැළ 1057 ක් නිකුත් කිරීම පිළිබඳ කිසිම විස්තරයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. සභිකයින් මඟින් පැළ 443 ක් අඩු ආදායම්ලාභී ජනතාවට බෙදා හැරීමට නිකුත් කර තිබුණද ඉන් පැළ 208 ක් ප්‍රතිලාභීන් වෙත බෙදාදුන් බවට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | පැළ, ගබඩාවට භාරගෙන විධිමත්ව බෙදාහැර සනාථ කිරීම් ලබාගෙන පසු විපරම් කළ යුතු වේ. | විෂයභාර නිලධාරිනිය ස්ථානමාරු කර ඇත. ඇය කැඳවා තොරතුරු ලබාගෙන විගණන විමසුමට පිළිතුරු සැපයීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මුදල් රෙගුලාසි 237 (ආ) | රු.57,500 ක වටිනාකම වූ පැළ මිලදී ගැනීමේදී ගබඩා ලේඛනවල පැළ ලැබීම් පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | අතපසු වීමකින් තොග ලේඛනයට ඇතුළත් කිරීමට නොහැකි වී ඇති බව දන්වමි. |
| (ඇ) 2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 30/2008 දරන චක්‍රලේඛය | රු.250,000 ඉක්මවා ආපදා ණය ගෙවිය නොහැකි වුවත්, එම මුදල ඉක්මවා රු.130,000 ක ආපදා ණය ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. | මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,082,004 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,212,819 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 18,995,250 | 5,666,614 | 4,653,400 | 3,328,303 | 15,284,500 | 16,807,420 | 11,687,897 | 5,119,523 |
| (ii) | කුලී | 5,816,500 | 6,003,902 | 5,823,682 | 215,358 | 6,162,400 | 5,262,080 | 5,022,080 | 239,809 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,060,000 | 890,100 | 890,100 | 6,000 | 1,021,000 | 1,011,150 | 1,006,150 | 5,000 |
| (iv) | වෙනත් ආදායම් | 2,189,000 | 15,695,330 | 10,750,426 | 7,088,893 | 2,154,500 | 2,613,700 | 2,613,700 | 2,000,000 |
| | | 28,060,750 | 28,255,946 | 22,117,608 | 10,638,554 | 24,622,400 | 25,694,350 | 20,329,827 | 7,364,332 |

### 2.2.2 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ජල ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු රු.4,208,589 ක් වූ අතර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මැතිවරණ ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් හිඟ ගාස්තු අයකර ගැනීමට නොහැකි වූ බව දන්වමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,925,504 ක් හා මුද්දර ගාස්තු රු.954,800 ක් විය. | කඩිනමින් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අය වෙමින් පවතින බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 10 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි කාර්යයන් සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගත යුතු වේ. | අත්‍යවශ්‍ය අතුරු ව්‍යවස්ථා සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් රැස්කරනු ලබන ටොන් 1/2 ක පමණ නොදිරන කසළ විධිමත්ව කළමනාකරණය කර නොතිබූ අතර, මිශ්‍රව රැගෙන එනු ලබන කසළ දූන්ඔය කුඹුර ඉඩමේ නිරාවරණව දමා තිබුණි. | විධිමත්ව කසළ කළමනාකරණය කළ යුතු වේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ප්‍රමාණවත් අයුරින් හඳුනාගෙන නොමැති අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් සකස්කර ඇති බව දන්වා ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ පවතින රු.1,270,178 ක ශේෂ නාගරික සංවර්ධන අධිකාරියේ අවසරය මත නගරයේ සංවර්ධන කටයුත්තකට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නගර සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිකිරීම් ව්‍යාපෘතියක් යෝජනා කළද 2019 වර්ෂයේදී ක්‍රියාත්මක නොවී ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2013 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත 2019 වර්ෂයට ද වරිපනම් අයකර තිබුණි. | වරිපනම් වසර 5 න් 5 ට තක්සේරු කර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 ජනවාරි 01 දිනට වරිපනම් ප්‍රතිශෝධනයක් කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇති බව දන්වමි. |
| (ඇ) | පැරණි සහා ගොඩනැගිල්ලේ බිම් මහල බදු දීමෙන් රු.195,913 ක හිඟ බදු මුදලක් අයකර නොතිබුණි. මෙම ගොඩනැගිල්ල 2018 වර්ෂයේ සිට උපයෝජනයකින් තොරව පැවතුණි. | හිඟ මුදල් අය කළ යුතු අතර සියලු වත්කම් උපයෝජනය කළ යුතු වේ. | කාර්යාල හා සාප්පු සංකීර්ණයක් ඉදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | කුඩුගල පාරේ අඩු කුලී නිවාස 10 කින් 1992 තක්සේරුව අනුව කුලී අයකර තිබූ අතර 2010 වර්ෂයේ නව තක්සේරුව ක්‍රියාත්මක නොකිරීමෙන් සහා අරමුදලට රු.449,970 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව ලවා කුලී සංශෝධනය කරගත යුතු වේ. | 2010 හා 2019 වර්ෂවල තක්සේරු කර ඇත. විරෝධතා හේතුවෙන් 2010 තක්සේරුව ක්‍රියාත්මක නොකර පෙර ගාස්තුවම අයකරන ලෙස පළාත් පාලන කොමසාරිස් උපදෙස් ලබා දී ඇත. 2019 තක්සේරුව ක්‍රියාත්මක නොකර පෙර ගාස්තුවම අය කිරීමට මහා සභා අනුමැතිය ලැබී ඇති බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්යමණ්ඩලයේ තනතුරු 6 ක පුරප්පාඩු 7 ක් විය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 5 දෙනෙකුගේ අය නොවූ රු.558,621 ක ණය ශේෂයක් පැවතුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | වත්තේගම නගර සභාවේ තනතුරු 3 ක සේවක පුරප්පාඩු 3 ක් සඳහා බඳවා ගැනීමේදී නීති, රීති අනුව ලකුණු ලබා නොදීම, ස්වේච්ඡා පදනම මත බඳවාගත් අයට ලකුණු ලබාදීම හා ව්‍යාජ සේවා සහතිකවලට ලකුණු ලබාදීම හේතුවෙන් සභාවේ සේවය කළ සේවකයන්ට හා නගර සභා බල ප්‍රදේශයේ අයට අසාධාරණයක් සිදුවී තිබුණි. | බඳවා ගැනීම් සිදු කිරීමේදී විනිවිද භාවයෙන් කටයුතු කළ යුතු වේ. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලකුණු ලබාදී බඳවාගෙන ඇති බව දන්වමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් අක්කර 8 1/2 ක වපසරියකින් යුත් දෙල්ගහකන්ද ඉඩමේ නිවාස 30 න් නිවාස 10 ක ඉඩම් වෙනුවෙන් කිසිදු මුදලක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, 2015 වර්ෂය වන විට මුදල් ගෙවූ ඉඩම් හිමියන් හට ඔප්පු ලබා දීමට කටයුතු නොකිරීම නිසා 2019 වර්ෂයේ තක්සේරුව අනුව පර්චස් 1 කට රු.100,000 ක් වීම හේතුවෙන් ඉඩම් පැවරීම ගැටළුකාරී තත්ත්වයකට පත්ව තිබුණි. | විධිමත්ව මුදල් අයකර නීත්‍යානුකූලව ඉඩම් පැවරීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස් මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. එම අනුමැතිය ලද වහාම මෙම ගැටළුව විසඳීමට හැකිවනු ඇති බව දන්වමි. |

## 3.5 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 පෙබරවාරි 03 දින උප මෘදුකාංග 7 කින් සමන්විත මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීමට ආයතනයක් සමඟ, ගිවිසුම් ගතව එයින් වරිපනම් සහ ජල මෘදුකාංග පමණක් ස්ථාපිත කර තිබූ අතර ගිවිසුම්ගත වටිනාකමින් සියයට 68 ක් වූ රු.445,000 ක මුදලක් ගෙවා තිබුණද අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි. | මෙම පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත සම්පූර්ණ කරගත යුතුවේ. | මෘදුකාංග 7 කින් සමන්විත මෙම පද්ධතිය ස්ථාපිත කර සියයට සියයක් සාර්ථකව ක්‍රියාත්මක වේ. පුහුණු නිලධාරීන් ස්ථානමාරු වීම, ප්‍රසූත නිවාඩු හා පරිගණක ප්‍රමාණවත් නොවීම මත ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බව දන්වමි. |

## 3.6 වත්කම් කළමනාකරණය

### නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.333,700 ක් වටිනා වඩු යන්ත්‍රය හා රු.129,500 ක් වටිනා විදුලි ජනන යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ තක්සේරු කර අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 භාණ්ඩ සමීක්ෂණයේදී විකිණීමට සුදුසු බව තීරණය කර ඇති බව දන්වා ඇත. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**-------------------------------------------**

**අභ්‍යන්තර විගණනය**

**---------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත්කර ඇතත් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |